**තානාපති කාර්යාලය - ජපානය**

## ශ්‍රී ලංකාවේ මානුෂීය මෙහෙයුම් සඳහා සහන භාණ්ඩ පරිත්‍යාග කිරීම්.

ශ්‍රී ලංකාවට බලපා තිබෙන අයහපත් කාලගුණික තත්ත්වය සැලකිල්ලට ගනිමින්, විදෙස් රටවල වෙසෙවෙසෙන පරිත්‍යාගශීලීන් විසින් මානුෂීය ආධාර ලබා දීම සඳහා බොහෝ විමසීම් සිදු කරනු ලැබේ.

මේ වන විට ප්‍රකාශයට පත් කර ඇති සියලුම ආනයන භාණ්ඩ වල බදු නිදහස් කරමින් සරල ක්‍රියාවලියක් හරහා කඩිනම් නිෂ්කාශනය සහ බෙද හැරීම සඳහා අවශ්‍ය සියලු කටයුතු ශ්‍රී ලංකා රජය විසින් සූදනම් කර ඇත.

ඒ අනුව, එවැනි භාණ්ඩ ගැටළුවකින් තොරව ලංකාවට යැවීම රේගු නිෂ්කාශනය සහ බෙද හැරීම සඳහා වන මාර්ගෝපදේශයක් ලෙස පහත තොරතුරු සපයනු ලැබේ.

**1. පරිත්‍යාග කළ හැකි භාණ්ඩ මොනවාද?**

පවතින අවශ්‍යතා මත පදනම්ව අයිතම ලැයිස්තුවක් විදේශ කටයුතු අමාත්‍යාංශය විසින් සකස් කර ප්‍රකාශයට පත් කර ඇත.

**ලැයිස්තුව සඳහා සබැදිය :** https://mfa.gov.lk/en/

සියලුම පරිත්‍යාගයන් අගය කරන අතරම, ගුණාත්මකභාවය, ප්‍රමිතීන් සහ මිනිස් පරිභෝජනය සඳහා සුදුසු බව වැනි ජාතික මට්ටමේ පරාමිතීන් සපුරාලීම සඳහා ඇතැම් භාණ්ඩ විවිධ රෙගුලාසි යටතේ නියාමනය කර ඇති බව කරුණාවෙන් සලකන්න. පරිත්‍යාග කරන ලද භාණ්ඩ ද මෙම අවශ්‍යතාවලට යටත් වේ. කෙසේ වෙතත්, එවැනි භාණ්ඩ ලැබුණු අවස්ථාවක, අදාළ නියාමන අධිකාරිය ඒවා පරීක්ෂා කර නිෂ්කාශනය සඳහා අවසර ලබා දෙන්නේ ඒවා නියාමන අවශ්‍යතා සපුරාලන්නේ නම් පමණි.

**2. ශ්‍රී ලංකාවට පරිත්‍යාග යවන්නේ කෙසේද?**

ඕනෑම පුද්ගලයෙකුට හෝ සංවිධානයකට ඕනෑම ප්‍රවාහන ක්‍රමයක් භාවිතා කරමින් සහන භාණ්ඩ (ඉහත සඳහන්) රටට යැවිය හැකිය. තීරුබදු රහිත නිෂ්කාශනය සඳහා, සහන භාණ්ඩ තොග පහත සඳහන් ලබන්නා වෙත යොමු කළ යුතු බව කරුණාවෙන් සලකන්න:

**ලේකම්,**
**ආරක්ෂක අමාත්‍යාංශයේ ලේකම්,**
**ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය (DMC),**
**විද්‍යා මාවත, කොළඹ 07.**

සුමට හා කඩිනම් නිෂ්කාශන ක්‍රියාවලියක් සඳහා, කරුණාකර ප්‍රමාණය සහ ඇස්තමේන්තුගත වටිනාකම (රේගු නිෂ්කාෂන සදහා) සහිතව අයිතව ලැයිස්තුව භාණ්ඩ නැව්ගත කිරීමට ප්‍රථම DMC වෙත විද්‍යුත් තැපෑලෙන් යොමු කරන්න. (DMC හි විද්‍යුත් තැපෑල සහ සම්බන්ධතා තොරතුරු මෙම ලේඛනයේ අවසානයේ සදහන් කර ඇත.

**සහන භාණ්ඩ තොග පහත සඳහන් කාණ්ඩ යටතේ යැවිය හැකිය.**

**2.1 රජයෙන් රජයට යවන භාණ්ඩ තොග:**

2.1.1 ශ්‍රී ලංකාවේ අදළ රාජ්‍ය තාන්ත්‍රික දූත මණ්ඩලයට යවන රාජ්‍ය තාන්ත්‍රික භාණ්ඩ තොගයක් ලෙස.

2.1.2 ආපද කළමනාකරණ මධ්‍යස්ථානය යටතේ ආරක්ෂක අමාත්‍යාංශයේ ලේකම් වෙත සෘජුවම යවන භාණ්ඩ ා තොගයක් ලෙස.

**2.2 පුද්ගලයින්/සංවිධාන වලින් යවන භාණ්ඩ තොග**

2.2.1 ආපද කළමනාකරණ මධ්‍යස්ථානයට යාමු කරන ලද භාණ්ඩ තොගයක් ලෙස

2.2.2 ශ්‍රී ලංකාවේ පුද්ගලයින් සහ සංවිධාන වෙත යාමු කරන ලද භාණ්ඩ තොගයක් ලෙස

**3. ශ්‍රී ලංකා රේගුවෙන් පරිත්‍යාග නිෂ්කාශනය කරන්නේ කෙසේද?**

සහන තොග රේගු නිෂ්කාශනය සරල කරන ලද රේගු ප්‍රකාශනයක් (CusDec) හරහා සිදු කරනු ලැබේ. අදළ නිෂ්කාශන මධ්‍යස්ථානවලදී ප්‍රමුඛතා පදනම මත, මුහුදු සහ ගුවන් භාණ්ඩ නැව්ගත කිරීම් නිෂ්කාශනය කිරීම සඳහා කවුන්ටර සහ කාර්ය මණ්ඩලය වෙන් කර ඇත.

ඉහත අංක 2 යටතේ හඳුනාගෙන ඇති සහන තොග කාණ්ඩ පහත පරිදි නිෂ්කාශනය කෙරේ:

**3.1 රජයෙන් රජයට යවන භාණ්ඩ තොග**

3.1.1 ශ්‍රී ලංකාවේ අදළ රාජ්‍ය තාන්ත්‍රික දූත මණ්ඩල වෙත යවන රාජ්‍ය තාන්ත්‍රික භාණ්ඩ,

නිෂ්කාශනය අදළ රාජ්‍ය තාන්ත්‍රික දූත මණ්ඩලය විසින් තීරුබදු රහිත පදනම මත DMC හි සහාය ඇතිව සිදු කරනු ලැබේ.

3.1.2 DMC යටතේ ආරක්ෂක අමාත්‍යාංශයේ ලේකම් වෙත සෘජුවම යවන භාණ්ඩ තොග

DMC විසින් තීරුබදු රහිත පදනම මත නිෂ්කාශනය සිදු කරනු ඇත.

3.2 පුද්ගලයින්/සංවිධාන වලින් යවන භාණ්ඩ

3.2.1 ආපදා කළමණාකරන මධ්‍යස්ථානය වෙත යොමු කරන ලද භාණ්ඩ තොග

DMC විසින් තීරුබදු රහිත පදනම මත නිෂ්කාශනය සිදු කරනු ඇත.

3.2.2 පුද්ගලයින් සහ සංවිධාන වෙත යොමු කරන ලද භාණ්ඩ තොග

ශ්‍රී ලංකාවේ භාණ්ඩ තොගය ලබන්නා විසින් හිමිකාරිත්වය DMC වෙත පැවරීමට එකඟ වන්නේ නම්, නිෂ්කාශනය තීරුබදු රහිත පදනම මත DMC විසින් සිදු කරනු ලැබේ. කෙසේද වුවද, භාණ්ඩ ප්‍රවාහනය (පෙරගෙවුම් සිදු කර නොමැති නම්), දේශීය නැව්ගත කිරීමේ ගාස්තු, නිෂ්කාශන ස්ථානයේ හැසිරවීමේ ගාස්තු වැනි භාණ්ඩ තොගයට අදළ අනෙකුත් සියලුම ගාස්තු (Freight, Local, Shipping line charges, Handling charges etc. අදළ ආයතනය / පුද්ගලයා විසින් දැරිය යුතුය.

ශ්‍රී ලංකාවේ භාණ්ඩ තොගය ලබන්නා තමන්ගේම නමින් හෝ ආයතනයක් සංවිධානයක් යටතේ නිෂ්කාශනය කිරීමට බලාපොරොත්තු වන්නේ, අදළ සියලුම බදු හා ගාස්තු ගෙවමින් එම භාණ්ඩ අදළ භාණ්ඩ ලබන්නා හෝ ආයතනය විසින් නිෂ්කාශනය කළ යුතුය. එබැවින්, සියලුම සහන තොග තීරුබදු රහිත නිෂ්කාශනය සඳහා ආපදා කළමනාකරණ මධ්‍යස්ථානයට යොමු කරන ලෙස උපදෙස් දෙනු ලැබේ.

**4. බෙදා හැරීම සිදු කරන්නේ කවුද?**

ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය යටතේ නිෂ්කාශනය කරන ලද භාණ්ඩ බෙදා හැරීම රජය විසින් තීරණය කරන ලද මාර්ගෝපදේශවලට අනුකූලව සිදු වේ.

වැඩිදුර පැහැදිලි කිරීම් සඳහා, කරුණාකර පහත සඳහන් අය අමතන්න;

ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය:
ජගත් මහේන්ද්‍ර මහතා - නියෝජ්‍ය අධ්‍යක්ෂ
ජංගම දුරකථන : +94 77 395 7905
විද්‍යුත් තැපැල : jagathm@dmc.gov.lk

විදේශ කටයුතු, විදේශ රැකියා සහ සංචාරක අමාත්‍යාංශය:
සුගීශ්වර ගුණරත්න මහතා
ජංගම දුරකථන: +94 70 233 8591
විද්‍යුත් තැපැල: sugeeshwara.gunaratna@mfa.gov.lk

අන්සුල් ජාන් මිය
ජංගම දුරකථන: +94 71 249 9254
විද්‍යුත් තැපැල: anzul.jhan@mfa.gov.lk

ශ්‍රී ලංකා රේගුව:
විද්‍යුත් තැපැල: relief25@customs.gov.lk
ක්ෂණික ඇමතුම් අංකය: +94 70 475 2823

පළ කරන ලද දිනය : 01.12.2025